හැටන් - දික්ඔය නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 11 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (I) | ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කළ අයවැය යුතුඋසාවි දඩ මුදල් රු.645,475 ක් සහ රු.1,074,594 ක ප්‍රාග්ධන ආධාරමුදල්, ආදායම් වියදම් ගිණුම බැර කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළයුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. |
| (II) | වර්ෂයේ ආදායම ලෙසට ගිණුම්ගත කළ යුතු රු.421,315 ක ආදායම් සහ සමුච්චිත අරමුදලට බැරකළ යුතු රු.174,700 ක ආදායමක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තැන්පත් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසු නිවැරදි කර ඇත. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම .

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විස්තරාත්මක උපලේඛන සමීක්ෂණවල වාර්තා සහ ශේෂ තහවුරු කිරීම වැනි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,223,996 ක් වූ ගිණුම් ශේෂ 04 ක් විගණනයේදි සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වන ශේෂ තහවුරු කරන ලේඛන සහ වාර්තා ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරියේදි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමය කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(I) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට වසර 07 සිට වසර 29 දක්වා කාල පරාසයක් ගතවී ඇති ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.13,135,912 ක් අයකර නොතිබුණි | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

(II) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 සිට වසර 07 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.174,468 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ රු. 46,159 ක්වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. . | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,902,395 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.54,850,010 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 158 (4) උප වගන්තිය ප්‍රකාරව අතිරික්ත මුදල්, අනුමත සුරැකුම්පතක ආයෝජනය කළ යුතු වුවද, වර්ෂය පුරාම රු.44,000,000 කට අධික මුදලක් එසේ ආයෝජනය නොකර ජංගම ගිණුම් 02 ක රඳවාගෙන තිබුණි. | පනතේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළයුතු වේ. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඉඩම් යන්ත්‍ර උපකරණ මිළදීගැනීම පිණිස අවශ්‍ය ඕනෑම විටක ලබාගත හැකි පරිදි මුදල් රඳවාගෙන ඇත. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 17,250,000 | 18,023,950 | 15,554,625 | 7,499,127 | 12,250,000 | 17,671,816 | 15,285,476 | 5,030,602 |
| කුලී | 18,540,000 | 14,277,670 | 12,034,313 | 6,721,223 | 20,120,000 | 14,692,519 | 14,171,292 | 4,297,588 |
| බලපත්‍ර ගාස්තු | 18,880,000 | 867,816 | 870,816 | - | 15,275,000 | 2,318,939 | 2,344,939 | 9,000 |
| වෙනත් ආදායම් | 12,955,000 | - | 5,143,499 | - | 18,676,000 | - | 20,486,608 | - |
| | 67,625,000 | 33,169,436 | 33,603,253 | 14,220,350 | 66,321,000 | 34,683,274== | 52,288,315 | 9,337,190 |

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.661,412 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.23,415,180 ක් අයකර නොතිබුණි. | කාලීනව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා අඥාපනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 03 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 | නගර සභා ආඥා පනතේ සඳහන් පරිදි අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පැනවීම සම්බන්ධයෙන් අනුමැතිය ඉල්ලා ප්‍රධාන අමාත්‍යතුමා වෙත ලිපි යොමු කර ඇත. |

දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ). ගලිරථ සේවය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොතිබීම හේතුවෙන් සභාව සතු ගලිරථය සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා දෙකකදී පමණක් සේවාව ලබාදී තිබූ අතර ඉතිරි කාලය තුළ නිශ්කාර්යව පැවතුණි. | ප්‍රතිචක්‍රීකරණ ඒකකයක් ඉදිකර ගලි රථ සේවා ලබාදීමට කටයුතු කළ යුතුය. | උසාවි නියෝගයක් අනුව ගලි අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය තහනම් කර ඇති බැවින් සුදුසු ස්ථානයක් පිළියෙල කිරීමෙන් පසු යළි සේවය සපයන බව. |

(ඇ). ජීව වායු නිෂ්පාදන ව්‍යාපෘතිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේදී රු.1,964,375 ක මුදලක් වැයකර ඉදිකර තිබුණු ජීව වායු ඒකකය, ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම නිසා අතහැර දමා තිබුණි. | ජීව වායු ඒකකය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිසි අධීක්ෂණයෙන් යුක්තව ව්‍යාපෘතිය පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. |

(ඇ). ජුකී මැෂින් පුහුණු මධ්‍යස්ථානය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගොස් තිබුණු ජුකී මැෂින් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු වසර 06 ක පමණ කාලයක සිට ක්‍රියාත්මක නොවී පැවතුණි. 2019 ජනවාරි 24 දින වන විටත් ජුකී මැෂින් යන්ත්‍ර 06 මධ්‍යස්ථානය තුළ නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මධ්‍යස්ථානයේ කටයුතු ඇරඹීමට ස්ථානය සකස් කරමින් පවතින අතර ඉදිරියේදී වැඩ ආරම්භ කරමි. |

(ඉ) නැණ පියස

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ------------------------------- |
| "ඊ නැණ පියස" මධ්‍යස්ථානයේ කටයුතු නවතා දමා තිබූ අතර, 2019 ජනවාරි 24 දින වන විටත් එහි පැවති උපකරණ ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතිණි. | ව්‍යාපෘතිය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මධ්‍යස්ථානයේ කටයුතු ඇරඹීමට ස්ථානය සකස් කරමින් පවතින අතර ඉදිරියේදී වැඩ ආරම්භ කරමි. |

(ඊ) තිරසර සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ------------------------------- |
| සභාව තිරසර සංවර්ධන යෝජනා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා අනුමත කර තිබුණු අයවැය ලේඛනයේ මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් වැඩසටහන්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 අයවැය යෝජනා තුළ මෙම අරමුණ ඇතුළත් කර ඇත. |

(උ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | ------------------------------- |
| 2017 සැප්තැම්බර් 19 දින ගෙන තිබුණු රු.37,000 ක් වටිනා කොන්ක්‍රීට් කසළ බඳුන් 10 ක් බෙදා නොහැර සභාවේ වාහන අංගනයේ රඳවා තිබුණි. | කඩිනමින් බෙදා දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී බෙදා දීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාරයක්ෂමතා
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති සභාවට අයත් හැටන් තානායම වෙනුවෙන් 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු රු.825,240 න් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා පවත්වා ඉදිරියේදී මුදල් ලබා ගැනීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

(අ). සේවක පුරප්පාඩු හා අතිරික්ත
----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 16 ක පැවති පුරප්පාඩු 72 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

(ආ). විනය කටයුතු
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභාවේ ගබඩා භාරකරුවකු 1996 දෙසැම්බර් 16 දින සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:12 යටතේ විශ්‍රාම ගන්වා තිබුණු අතර, 2015 ජනවාරි 13 දින මියගොස් තිබුණි. මෙම නිලධාරියා විශ්‍රාම ගන්වා වසර 21 ට වැඩි කාලයක් ගතවී ඇතත්, අදාළ විනය පරීක්ෂණ පවත්වා ඒ අනුව සිදුකළ යුතු කටයුතු 2019 ජනවාරි 24 දින වන විටද සිදුකර නොතිබුණි. | විනය කටයුතු කඩිනමින් නිමකර අදාළ නියෝගය අනුව කටයුතු කළ යුතුවේ. | මේ වන විට විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමට අදාළ සියලු කාර්යන් නිම කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ඉඩම් දීර්ඝකාලීනව බදු දීමේදී අවස්ථා 84 කට අදාළව නගර සභා ආඥා පනතේ 36 (ඉ) (II) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන අතර අනාගතයේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කළ යුතුවේ. | ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය.

3.5.1 නිශ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ධාවනයෙන් ඉවත්කර තිබුණු වාහන 4 ක් මාස 08 සිට වසර 22 ක දක්වා කාලයක් අතර අලුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට අපහරණය කිරීමට හෝ කටයුතු නොකර වාහන අංගනයේ ගාල්කර තිබුණි. | සුදුසු පරිදි කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අවශ්‍ය පියවර ගන්නේමි. |
| (ආ). | සභාවට අයත් දික්ඔය නගරයේ පිහිටි M.A.S අබුසාලි ශාලාව හා එහි පවතින උපකරණ වර්ෂය පුරාම ප්‍රයෝජනයට නොගෙන වසාදමා තිබුණි. | ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව සොයාබලා කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අවශ්‍ය පියවර ගන්නේමි. |

3.5.2 වාහන උපයෝජනය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | සභාව සතු වාහන 14 කට අදාළව 2017 සහ 2018 වර්ෂ වෙනුවෙන් දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | ධාවන සටහන කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | අඩුපාඩු සම්පූර්ණ කර ඉදිරියේදී ධාවන සටහන් ඉදිරිපත් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ). | මෙම වාහන 14 වෙනුවෙන් 2018 වර්ෂය සඳහා ඉන්ධන වියදම් වශයෙන් රු.5,749,895ක් සහ අලුත්වැඩියාවන් වෙනුවෙන් රු.681,025 ක් වැයකර තිබුණි. ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම නිසා මෙම ඉන්ධන වියදම් රාජකාරී කටයුතු සඳහා දරන ලද වියදම් බව විගණනයට සනාථ කරගත නොහැකි විය. | ධාවන සටහන කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | අඩුපාඩු සම්පූර්ණ කර ඉදිරියේදී ධාවන සටහන් ඉදිරිපත් කරමි. |
| (ඇ). | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් පරිදි සභාවට අයත් වාහන 14 හි ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවක් සිදු කර එම නිර්දේශයන් අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාවන් කිරීමට කටයුතු කරමි. |